# ලෝවැඩ සඟරාව.

වීදාගම

**මහා ස්ථවිර ස්වාමිපාදයානන්වහන්සේ විසින්**

රචණා කරණලදී.

බෝරුග්ගමුවේ

**රේවත ස්වාමීන් විසින් ලියනලද**

## භාවසන්න ශුකතයි.


ගංගොඩැවිල

**විද්‍යාලෝක බෞද්ධ සමාගම විසින්**

මුද්‍රණය කරවනලදී.

**ශ්‍රී. බු. ව. 2460.**

"සදරැස යන්ත්‍රාලයේ මුද්‍රිතයි."

# ලෝවැඩ සඟරාව.

මෙම මධුර මනොහර ධර්ම කාව්‍යය වනාහි මීට අවුරුදු හාරසියයකට පමණ පෙර වීදාගම මහා විහාරාධිපතිව වැඩ විසූ බුදුගුණාලඞ්කාරාදියෙහි කර්තෘභූත **මෛත්‍රෙය මහාස්ථවිර** ස්වාමිපාදයානන් වහන්සේ විසින් රචනා කරණලදී.

ඒ කාලයෙහි පටන් මේ වනතුරු ලක්වැසි සියලු ගිහි පැවිදි උතුමන් විසින් සමාදරයෙන් පිළිගෙණ ශිෂ්‍යයන්ට අක්ෂරොච්චාරණය පිණිසද කවි කීම ප්‍රගුණකරවීම පිණිසද ධර්මය උගන්වා හික්මවනු පිණිසද යනාදි ප්‍රයොජන සලකා පුරුදු පුහුණු කරවාගෙණ එනු ලැබේ.

එසේදවුවත් මෙහි අගය නැතිවන තරමට වරදවාද අක්ෂර වින්‍යාසය ගැණ කිසිත් නොසලකාද කීපදෙනෙකුන් විස්න් නොනිසි ලෙස අච්චුගස්වන ලද බවද පෙණේ. පසුගිය බෞද්ධ පාඨශාලා සඞ්ගමය විසින්ද මෙය උසස් පඞ්ක්ති වල ශිෂ්‍යයන්ට උගැන්වීමට නියමකරගන්නා ලද්දේය.

එබැවින් බෝරුග්ගමුවේ **රෙවත ස්ථවිරයන්** වහන්සේ විසින් බාල ජනයාගේ අභිවෘද්ධිය සඳහා ලියන ලද භාවසනනය හා සුධකරදෙන ලද පොතද මෙසේ මුද්‍රණයකරවීමු.

මෙහිද 1 වෙනි සන්නයෙහි "මම සතොසින් නමස්කාර කරමි" යන්නෙහි සතොසින් යනු අඩුවීද, 10 වෙනි කවියේ "පව්කොට" යනු "පව් නොට" කියා සමහර පොත්වල අච්චු ගැසී තිබේ. එබඳු තව සුලු දොස් කීපයක් දක්නාලද නුමුත් අර්ථ හානියක් නොවේයයි සිතෙන බැවින් ශුද්ධිපත්‍රයක් යෙදීමට ඕනෑ නොකෙලෙමු.

## සන්න සහිත

# ලෝවැඩ සඟරාව.

සෙත් සිරි දෙන මහ ගුණ මුහු   දනන්
සත් හට වන බවදුකට වෙ   දනන්
තිත් ගණඳුරු දුරලන දිනි   දනන්
සිත් සතොසින් නමදිම් මුනි   දනන්

නිවන් සිරි සැපත දෙන්නාවූ මහත්වූ ගුණයන්ට මහා සාගරය වැනිවූ ලොකසත්ත්වයාට ඇතිවන්නාවූ ජාති ජරා මරණාදි සංසාර දුඃඛයන්ට ශ්‍රෙෂ්ඨ වෛද්‍යාචාර්‍ය්‍යයෙක් වැනිවූ තීර්ථක නැමති ඝනාන්ධකාරය දුරලීමට සූර්‍ය්‍යයා වැනිවූ මුනීන්ද්‍රවූ සර්‍වඥයන්වහන්සේට මම නමස්කාර කරමි.

2

ඇමපම   ණින් පැවසු මුනි දැනත   තු
මෙමහැම   දෙන බලවයි දැක්විය යු   තු
තමතම   නැණපමණින් දැනගත යු   තු
මමනම   දිම් සදහම් පැහැදී සි   තු

මුනීන්ද්‍රයන්වහන්සේ ලොක ස්වභාවය දැන සියල්ලන්ගේ ප්‍රමාණ වශයෙන් ප්‍රකාශකළාවූ සකල ජනයෙනි මෙය බලවයි කියා දැක්විය යුතුවූ ගුණ ඇති තම තමන්ගේ ඥාණ ශක්ති ප්‍රමාණයෙන් අවබොධකටයුතුවූ ශ්‍රී සද්ධර්‍මයද මම ප්‍රසනනසිතින් නමස්කාර කරමි.

3

සිරිමත්   බඹ සිරසෙහි පාපිසි   නා
සැරියුත්   මහ මුගලන් පිළිවෙළි   නා
පිළිවෙත්   සරුමහ සඟගණ සොබ   නා
මුදුනත්   බැඳ නමදිම් බැතිපෙම්   නා

9

සි තු ව ත් බියකරවන අරතර යේ
වැටුනොත් එක්සිය සතිසක් නිර යේ
බ ල ව ත් දුක් විඳිනෙය කරදර යේ
ම ද කු ත් පිණකට නැත අවසර යේ

සිහිකල පමණකිනුත් දරුණුතරවූ බියකරවන්නාවූ එක්සිය සතිස්නරකයෙහි වැටුනේවිනම් කොතෙක් බලවත් දුක් විඳින්නේය. එහෙයින් එබඳු අපායෙක්හි කුශල් කිරීමටස්වල්පයකුදු අවකාශයක් නැත්තේය.

10

ති රි ස න් ජාතිය උපනත් පව් නො ට
අ ව ස න් නොව බිය පවතී පිට පි ට
ම ද ස න් සුන් කමකුත් නැත හැමවි ට
ස ල ස න් නෝ කෙලෙසද සිතු පිණක ට

පව්කර තිරිසන් ජාතියෙහි උපන්නත් අවසානයක් නොවී භීතිය පිටපිටම පවත්නේය, සෑම කල්හිම මද සන්සුන්කමකුත් නැත්තේය, එහෙයින් සිත පිණකට සලසන්නේ (යොදන්නේ) කෙසේද?

11

උ ප න ත් පේතව පව්කොට නොප න ත්
ක ල ක ත් නොලැබෙයි සෙම්සොටු පමණ ත්
උ ගු ර ත් නොතෙමෙයි සුරගඟ වැටු න ත්
කලෙකත් පින් නොකළැකිමයි සිතු න ත්

ධර්මයට නැත්තාවූ අයුතුවූ පාපකර්මකොට ප්‍රේතව උපන්නේනම් දීර්ඝකාලයෙක්හිදීවත් සෙම්සොටු පමණවූවත් ආහාරයක් නොලැබේ, දිව්‍ය නදියෙහි වැටුනේවී නමුත් උගුරවත් නොතෙමෙන්නේය, (උගුර තෙමීමට පමණ ජලයකුදු නොලැබේ.) සිතුනේවිනුමුත් පින් කිරීමට කවරකලෙකවත් නොහැක්කේය.

12

පව් මිස පිණකැයි නොකරණ හැමකල
මුනිබණ නොපවතිනා පිට සක්වල
නිසිලෙස උපනත් ලැබදුන මනකල
කිසිකල කත් කුසලක් නොකළැකි බල

සෑමකල්හි පවු මිසක් පිණකැයි කියන ලද්දක් නොකරන්නාවූ සර්වඥ ධර්මය නොපවතින්නාවූ පිටසක්වලෙක්හි සිත් සතුටුකරන්නාවූ දනය ලබා නිසි ආකාරයෙන් උපන්නේවීනමුත් කිසිකලෙකත් බලවත් කුශලයක් නොකට හැක්කේමය.

13

දද මිනිසුන් බස්ගෙණ කිසිකලෙකය
තද අකුසල්කොට කුසලින් වැලකය
අඳ ගොලු බිහිරිව ලදුවත් මේකය
මද පිණකුත් නොපිරෙයි බල නිසැකය

සමහර කාලයෙක්හි දණ්ඩ මනුෂ්‍යයන්ගේ බස් අදහාගෙණ කුශල ක්‍රියාවෙන් වැලකී රෞද්‍ර අකුශල්කොට අණ්ඩව ගොලුව බිහිරිව මේ ශරීරය ලදුයේවීනමුත් මද පිණකුත් සම්පූර්ණ නොකරෙයි. නිසැකව මෙය බලව.

14

සිත මිස කය නැති බඹලොව සතරකි
සිත නැතිවම කය ඇති බඹතලයකි
මෙද සත පින්කොට උපදින පෙදෙසකි
එහි උපනත් කුසලක් නොමකළහැකි

සිත මිසක් කය නැත්තාවූ බ්‍රහ්මලොක සතරකි, සිත නොමැතිව කය ඇත්තාවූ එක් බ්‍රහ්ම ලොකයෙක, සත්වයන් විසින් (බ්‍රහ්මාගමේ නියම පරිදි) පින්කොට මේ ස්ථානයද උපදින්නාවූ ප්‍රදෙශයක්ය, එහි උපන්නේවිනුමුත් කුශල කර්මයක් නොකටහැක්කේය.

15

බලකොටු වන් තර මෙසසර නුව රේ
මුල සැවු වන් දළුලන පව්පඳු රේ
විස කටු වන් සග මොක් මග අතු රේ
මිස දිටු වන් අයටත් පින් නොපි රේ

මේ සංසාර නැමති මහත් නගරයෙහි බල කොටුවක් වැනිවූ පාප නැමති පඳුරෙහි දලු ලන්නාවූ ඇසවු මුලක් වැනිවූ ස්වර්ගමොක්ෂ මාර්ගයන් අතුරෙහි විෂකටු වැනිවූ මිථ්‍යාදෘෂ්ටි ජනයාටත් පිණක් නොපිරෙන්නේය.

16

බුදු කෙනෙකුන් මේ ලොව නූපන්ව ර
අඳු රෙක්මය සදහම් නැති මෙසස ර
ඉඳු රා නොදැනෙයි පව්පින් තොරතු ර
සිදු නොකළැකි ඉන් සගමොක් සිරිස ර

බුදුකෙනෙකුන් මේ ලොකයෙහි නූපන්නාවූ කාලයෙහි සද්ධර්මය නැත්තාවූ මේ සංසාරය අන්ධකාරවූයේය. පවු පින් විභාගයද ප්‍රත්‍යක්ෂ වශයෙන් නොදන්නේය, එසේහෙයින් ස්වර්ග මොක්ෂ ශ්‍රීසාරය සිදුකරගත නොහැක්කේය.

17

සැබවින් බණ ඇසුවොත් මුනිඳුන් කී
ගොලු වන් බිහිරන්සේ නොව සැල කී
ඉදිනෙන් මිස තොප කුසලෙන් වැල කී
මෙලෙසින් පින් නොකළැකි කල් අටෙ කී

ගොලුවන් බිහිරන් මෙන් නොවී සලකාගෙණ මුනින්ද්‍රයන්වහන්සේ විසින් වදාළ ධර්මය සත්‍ය වශයෙන් ඇසූයේනම් තොපි අකුශලයෙන් මිදී ඉදිනවා මිසක් ( අකුශලයෙන් මිදීමට වෙන උපායක් නොමැත්තේය. ) මේ ආකාරයෙන් පින් නොකටහැකිවූ කල් අටක්වේ.

18

දිගු පුළුලින් සක්වළවල් සිදුකු ස
සිය වසකින් උඩඑන කැස්බා කි ස
වියසිදුරෙන් නැගෙතත් දුගතිය බැ ස
තව උපදින් නට බැරි මෙමිනිස් කු ස

දිගින් හා පුළුලින් යුත් සක්වළවල් අතුරෙහි පිහිටි සාගරය තුලින් සියක් අවුරුද්දකින් උඩට එන්නාවූ කැස්බාවාගේ හිස වියසිදුරකින් ඉතා දීඝීකාලයකින් නැගෙතත් දුගතිය උපන්නේ නම් තව එපමණ දීඝී කාලයකින්වත් මිනිස් කුසක උපදින්නට බැරිවන්නේය.

19

කා ල කි නි බුදුකෙණෙකුන් උපදි න් නේ
දු කා කි නි මිනිසත් බව ලැබග න් නේ
මෙදෙකිනි මෙසසර දුක් දුරල න් නේ
සු ද නෙ නි කිම වීරිය නොකර න් නේ

බුදුකෙණෙකුන් උපදින්නේ දීඝීකාලයකින්ය, මනුෂ්‍යාත්මභාවය ලබාගන්නේද දුකසේය, මේ කරුණු දෙකින් මේ සංසාරදුඃඛය දුරුකරන්නේය, සාධු ජනයෙනි මේ කාලයෙහි නිවණට යාම පිණිස වීරිය නොකරන්නේ කිමද?

20

ප ස් පව්කොට මෙතනත් ලැබ සෝ කා ය
ගොස් නිරයේ දුක් විඳිති අනේ කා ය
රැ ස් කොට ඉන් පින් මෙමිනිස් ලෝ කා ය
සි ස් නොකරව් කලකින් ලත් මේ කා ය

ප්‍රාණඝාතාදි පස්පව්කොට මෙහිදීත් ශොකය ලබා මෙයින් ගොස් නරකයෙහි නොයෙක් දුක් විඳින්නාහ. එසේහෙයින් මේ මනුෂ්‍ය ලොකයෙහිදී කුශල සඬයකොට (යට කියන ලද නපුරු කාල අටින් තොරව) කාලයකින් ලැබූ මේ මනුෂ්‍ය කය කුශල් නොකිරීමෙන් හිස් නොකරව්.

21

කන්තන් මෙන් විස අඹ පලරි ස් සේ
මන් සන් තොස්කර කිම පල සෙ ස් සේ
දූන් දූන් එයි මරුවා පසුප ස් සේ
ඉන් පින් මය කටයුතුනම් ද ස් සේ

රුචියෙන් කිම්පක්කනම් විෂ අඹ කන්නාවුන් මෙන් ලෞකික සැපයෙන් සිත සතුටුකොට ස්වල්පයක්වත් ඇති ඵලය කිම! මරුවා පසු පස්සෙහි දූන් දූන්ම එන්නේය, එබැවින් දක්‍ෂව කටයුතුනම් කුසල්මය.

22

ඉ ස ගිනිගත්තෙකු එගිනි නිවණ ලෙ ස
කු ස ලට මදකුත් පමානුවොත් මි ස
මෙස සර අත්ඇර නොයන මෙදුක් රැ ස
වෙස සින් නැත අත්අරිණ උපදෙ ස

ඉස ගිනිගත්තෙකු නොපමාව ඒ ගින්න නිවා ගන්නාක්මෙන් කුශලයට ඇසිල්ලක්වත් පමානුයේනම් මිසක් මේ සංසාරය පහනොකොට නොයන්නාවූ දුක් සමූහය අත්හරින්නාවූ අන්‍ය උපදෙශයක් හෝ උපායක් ඒකාන්තයෙන්ම නැත්තේය.

23

තැ ත කින් ගෙණදූමුවත් කැට නුබ කු ස
අ ත රක නොරඳනමෙන් මේ බිම මි ස
සි ත සතොසින් පින් නොකලොත් නිසිලෙස
නැ ත සිටිනාතැන් සතරඅපා මි ස

උත්සාහයෙන් ගල්කැටයක්ගෙණ අහසට දූමූයේනම් මේ පෘථිවියෙහි වැටීම හැර අතරක නොරඳන්නාක්මෙන් සිත සතොසින් නිසියාකාර පින් නොකෙලේනම් සතර අපායෙහි වැටීම මිසක් නැවතී සිටින්නාවූ අන්‍ය ස්ථානයක් නැත්තේය.

24

ති ර ව නොසිත කුණුකය මෙත මා යේ
නොති ර බවට විදුලිය උප මා යේ
නි ත ර මෙකය පවකට නොන මා යේ
ක ර ව කුසල් විරිය නොප මා යේ

තමාගේ මේ දෙතිස් කුණපයෙන් යුත් ශරීරය ස්ථිරවශයෙන් නොසිතව, අස්ථිර බවට විදුලිය උපමාවේ, නිතර මේ කය පවකට නොනමා වීය්‍ර්‍යයෙන් ප්‍රමාද නොවී කුශල ක්‍රියා කරව.

25

අ ඳු රෙහි අස්ලොම විදිනට දුර දී
එ දු ලිය පැහැ වැරදුනහොත් වර දී
වි දු ලිය වන් මේකය ලත් තැන දී
සි දු නොකළොත් මතු සගමොක් වර දී

අන්ධකාරයෙහි අශ්වරෝමය දුර සිට විදිනු පිණිස විදුලි ආලොකය වැරදුනේවීනම් විදීම වරදින්නේය, විදුලියක් වැනිවූ අස්ථිර මේ කය ලැබූ කාලයෙහි කුශල ධර්‍මයන් සිදුකර නොගත්තේනම් මතු කාලයෙහි ස්වර්ගය හා මොක්ෂය වරදින්නේය.

26

කොතන උනත් නැත මරුහට බා දා
වි දි න මෙසැප පින් ඇතිතෙක් වේ දා
ගෙ ව න සසර දුක් බුදුබණ නා දා
කු ම න නැටුම් කෙළි කවටසිනා දා

මරණයට කොයි ස්ථානයක් උනේවීනමුත් බාධාවක් නැත්තේය, විදින්නාවූ මේ සම්පත්තිය පින් ඇතිතෙක් නොවේද සසරදුක් ගෙවන්නාවූ බුදුබණ නොඅදහා කුමන නැටුම්ද කුමන කෙළිද කුමන සිනාවක්ද?

27

සැදූ හැත් තන්හට බවදුක් නොකැමැ ති
යහපත් කල් මෙ කල් මිස වෙන නැ ති
දනිතොත් දන් සිල් ගුණසත නොනැව ති
පැයකුත් අව්රුදු දහසක් විතරැ ති

සසර දුක නොකමැතිවූ ශ්‍රද්ධාවතුන්ට මේ බුද්ධොත්පාද කාලය හැර පින්කිරිමට යහපත් කාලයක් වෙන නැත්තේය, සත්වයා දාන ශීල යෙහි ඵලය දනිනම් අප්‍රමාදයාහට පැයකුත් අවුරුදු දහසක් පමණ අගයවන්නේය.

28

අද අද එයි මරු පින්කරග න්නේ
කෙලෙසද සෙට මරු නේති සිත න්නේ
කිකලද මහසෙන් මරු ඇපව න්නේ
කුමටද කුසලට කම්මැලි ව න්නේ

මරණය අද අදම ඒයයි සිතා පින්කරගන්නේය, සෙට මරණය නොඑන්නේයයි සිතන්නේ කෙලෙසද? මහා සේනාවක් ඇත්තාවූ මාරයා ඇපවන්නේ කවර කාලයෙක්හිද? එබැවින් කුශලට කම්මැලිවන්නේ කුමක්නිසාද?

29

කුමටද කාබී නිති සැරසෙ න්නේ
කොතනද මේකය ඇරගණි ය න්නේ
ඇමසද නොමැලිව පින්කරග න්නේ
එමවද බවසයුරෙන් ගොඩල න්නේ

කෑමබීමකොට නිරන්තරයෙන් සැරසෙන්නේ කුමන කාරණයකටද මේ කය අරගණියන්නේ කොයි ස්ථානයකටද සෑමකල්හිම කම්මැලි නොවී පින්කරගන්නේය, සංසාර සාගරයෙන් සත්වයා එතරකරන්නේ එම කුශලයමවද?

30

ත ර ව සසර සයුරෙන් තොප නොල සා
ති ර ව ලබන මොක් සැපසිරි සක සා
තොරව පවින් නිතරම මුනි බණ සා
ක ර ව කුසල් විරිය පසු නොබැ සා

තොප අලසනොවී සංසාරසාගරයෙන් එතරව සකස්ව ස්ථිරව නිර්වාණසුඛ ඓශ්වර්ය්‍යය ලබන පිණිස සර්වඥයන්වහන්සේගේ බණ අසා නිතරම පවින් තොරව වීර්ය්‍යයෙන් පසුබටනොවී කුසල් කරව.

31

හැ ම වි ට පිණටම සිතපා ද න් නේ
නි ව ණ ට මග එමවද සා ද න් නේ
වැ ඩ ක ට කීබස් කිමනා ද න් නේ
නි ර ය ට වන්කලඳු තොපි ද න් නේ

සෑම කාලයෙහි පිණටම සිත පහදවන්නේය. නිවණට මග සිද්ධකරන්නේ ඒ කුශල සිතම නොවේද? අභිවෘද්ධිය පිණිස කියනලද වචන නොඅදහන්නේ කිමද? තොපි දූනගන්නේ නිරයට වැටුනුකල්හිද?

32

මොක් සිරිදෙන මුනිඳුන්ගේ උපත කි
ක ප් කෙළ සියදහසකිනුත් නොලදූ කි
ප ත් වූ එබුදුන්ගෙන් යුත් මෙකල කි
එ ත් වැරදුන නැත පරලොව පිහිට කි

නිවන් සැප දෙන්නාවූ මුනිරජානන්වහන්සේගේ උත්පත්තියද කල්පකොටි ලක්ෂයකිනුත් ලැබිය නොහැක්කේය, ඒ බුදුරජානන්වහන්සේගෙන් යුක්තව ලැබුනාවූ මේ යහපත් කාලයකි, ඒ මේ කාලයද වැරදුනේනම් පරලොව පිහිටද නැත්තේය.

33

අ ත් වැඩ පරවැඩ සමව සිත න් නේ
මෙත් සිත සවුසත කෙරෙහි කර න් නේ
එ ත් බැරිනම් තොපි සසර ගෙව න් නේ
සෙත් පුර සැප කෙලෙසකද ලැබ න් නේ

ආත්මාර්ථය හා පරාර්ථය යන දෙකම සමානව සිතන්නේය, මෛත්‍රී චිත්තය සකල සත්ත්වයන් කෙරෙහි කරන්නේය, ඒ මෛත්‍රී කිරීමත් බැරි නම් තොපි සංසාරය ගෙවන්නේ කෙසේද, නිර්වාණ නැමති පුරයෙහි සැපය ලබන්නේ කෙලෙසද?

34

ම ස් ලේනැති ඇට බළු ලෙවක න් නේ
කු ස් පිරුමක් පලයක් නොලබ න් නේ
ලෙස් ඒ සැපතෙහි සැප නොසිත න් නේ
දෙ ස් නොපෙණෙනලෙස දුක්මයි ව න් නේ

මස් හා ලේ නැත්තාවූ ඇටකැබලි බලු ලෙව කන්නේනුමුත් බඩපිරිමක් පලයක්ද නොලබන් නේය, එසේවූ පස්කම් සැපයෙහි සැපයක්යයි (නුවනැති පුරුෂතෙම) නොසිතන්නේය, දෙස් නොපෙණෙනලෙස වන්නේ දුක්මයි.

35

මස් කැටියක් ගත් උස්සෙකු අහ සේ
මස් නොදමුව උස්සන්ගෙන් වැන සේ
පස් කම්රස ලොබකළහොත් එම සේ
පස් විසි මහ බයකින් දුක් සැල සේ

මස්කැටියක් ගත්තාවූ උකුස්සෙකු අහසෙහි ඒ මස්කැටිය නොදමුයේනම් අන්‍ය උකුසන් ගෙන් විනාශවන්නේය, එපරිද්දෙන්ම රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පස්කම් රතියෙහි ලොබය කෙළේනම් මහත්වූ විසිපස් බයකින් දුක් සැලසෙන්නේය.

36

සෙත සලසන මුනිබණ ඇත සුමිහි රි
ඇ ත තොප්ගේ කන් ඇසුමට නොබිහි රි
නැත කරණට පිණකුත් මෙතොපට බැ රි
ස ත ර අපා දුක්වද විඳිනට බැ රි

ශාන්තිය සලස්වන්නාවූ ඉතා මිහිරිවූ මුනිරජානන්වහන්සේගේ ධර්‍මයද ඇත්තේය, ඇසිම පිණිස බිහිරිනොවූ තොපගේ කන්ද ඇත්තේය, මේ තොපට පිණක් කිරිමටද බැරිනැත්තේය, සතර අපායෙහි දුක් වද විඳින්නට බැරි.

37

කරණ කලට පව් මීරිය මී සේ
විඳින කලට දුක් දූඹිවිය ගිනි සේ
ඇඳින එපව් දුරලන උපදේ සේ
නුදුන මැනවි තුන්දොර අවකා සේ

පාපය කරණ කාලයෙහි මීපැණිමෙන් මධුරය, විඳින්නාවූ කාලයෙහි දුඃඛය ගිනිමෙන් රෞද්‍රවූයේවේ, ඒ පාපයන් දුරුකරන්නාවූ උපදෙශය දැනගෙණ කය වචන සිත යන ත්‍රිවිධ ද්වාරය අවකාශ නුදුන මැනවි.

38

අදමින් ජීවත් වෙනවා විතර ට
දැහැමින් මියයනු සොඳමයි දනහ ට
මෙලෙසින් වදහල මුනිබණ සිහිකො ට
සැබවින් පින්කොට පැමිණෙව් නිවණ ට.

"අධර්‍මයෙන් ජීවත්වෙනවාට වඩා ධර්‍මයෙන් මියයාම ජනයාහට යහපත්මය" යි මේලෙසින් වදාළාවූ සර්‍වඥ වචනය සිහිකොට සත්‍ය වශයෙන් පින්කොට නිර්‍වාණයට ප්‍රවිෂ්ටවව්.

39

එ ක ම සතෙකු තම මව්මල දුක ට
වෙන ම හැඬූ කඳුලේ බිඳුවල ට
මෙහැම මුහුදුදිය අඩුවන කල ට
ත ව ම සසර ආලය ඇයි තොප ට

එකම සත්වයෙක් තමාගේ මව් මළාවූ දුකට වෙනම් හැඬුවාවූ කඳුලු ජලයේ බින්දුවලට මේ සතර සාගරයෙහි සියලු ජලය අඩුවන කල්හි මෙතාක්ම සංසාරයෙහි ආලය තොපට ඇයිද?

40

ලි ප ගිනි මොලවනතෙක් දිය සැ ළි යේ
සැප යක්යයි කකුළුව දිය කෙ ළි යේ
එ ප මණ තොපි සිතතොත් නොහැකි ළි යේ
සැප යක්නම් නැත කම්රස කෙ ළි යේ

ලිපේ ගිනි මොලවන තුරු දිය සැළියෙහි සැපයක්යයි සිතා කකුළුවා ජල ක්‍රීඩා කෙළේය, තොපි එපමණක්වත් නොහැකිළි සිතන්නහු නම් කාමරස ක්‍රීඩාවෙහි සැපයක් නම් නැත් තේය.

41

උඩු සුල හට අල්වාගෙණ ය න් නේ
තණසුල නොදැමීනම් අත ද න් නේ
වරපල යයි කම්රස තෙපල න් නේ
එද කළ කම් නිරයේ පැසව න් නේ

තණ සුල උඩු සුලහට අල්ලාගෙණ යන තැනැත්තේ එය නොදැම්මේවීනම් අතදන්නේය, පස්කම්රසය උතුම් පලයක්යයි අඥනයා කියන් නේය, ඒ පස්කම් රසයෙන් යුක්තව කරණලද කර්‍මය ඇත්තාද නිරයෙහි පැසවන්නේය.

42

පිරූ ලෙන් අරගත් අබරණ මඟුල ට
දමමින් ගැතිවන අයමෙන් අනුන ට
පෙරපින් ඇතිතෙක් විඳිනා සැපත ට
තොපිදූන් උඩඟුව නොවදිව් නිරය ට

මගුල් පිණිස නයට හැරගත්තාවූ ආභරණ යන් ඉවත දමා අන්‍යයන්ට දූසවන අයමෙන් පෙරකළාවූ පින් ඇතිතාක් විඳින්නාවූ සම්පත් තිය නිසා මේ වර්තමානයෙහි තොපි උඩඟුවී නර කයට නොයව්.

43

වද යට බැඳගෙණ ගෙණයන සොරු ටා
වද මල් දම්ලූ බෙර පිරිවර ටා
ලද ඉසුරෙහි ලොබවූවොත් පිණ ටා
එද සැපතෙහි කළකම් මරු රව ටා

මැරීමට බැඳගෙණ යන්නාවූ සොරාට දමන ලද වදමල් මාලයන්ද බෙර පිරිවරද වැනිවූ ලබනලද ඓශ්වර්‍ය්‍යයෙහි පිණට ලොබ වුව හොත් ඒ සැපයෙහි කරණලද ලොභකම් ඇති තැනැත්තාද මාරතෙම රවටන්නේය.

44

දූමුවෙන් ගිරිමුදුනෙන් හෙන සොරු ටා
පවනින් කම් නැතිමෙන් ඇහ ගිම ටා
ජරයෙන් මිදෙමින් යන මරු මුව ටා
සැපතින් කිම ඉන් කම්කළ තොප ටා

පර්වත මස්තකයකින් මැරීම පිණිස දූමීමෙන් පහත වැටෙන්නාවූ සොරාගේ ශරීර ශ්‍රීෂමයට වාතයෙන් පලක් නැත්තාක්මෙන් ජරාවෙන් ගැලවී මාරයාගේ මුඛයට යන්නාවූ පෙර කම් කළාවූ තොපට සම්පත්තියෙන් කවර ප්‍රයොජනද?

45

අ ල වන මේ කම් රස දෙස විම සා
ප ල යව් තපසට පුළුවන් වය සා
ප ල රසවිඳ ගසළඬ උන් මිනි සා
මු ල සිඳිනාතෙක් ඉඳියෝ නොබැ සා

ජනයාගේ සිත් ආලය කරවන්නාවූ මේ පස් කම් රසයෙහි දෙස් පරීක්‍ෂාකොට ශරීර ශක්ති යෙන් හා ප්‍රඥවෙන් පුළුවන්වූ කාලයෙහි තපස් කිරීමට පලයව්. පලරසය විඳිමින් (ගෙඩි කකා) ගස මුදුනෙහි උන්නාවූ මනුෂ්‍යයා ගසේ මුල කපනතුරු නොබැස ඉඳිද?

46

බණනම් නිබොරුය මුනිවරයි න් නේ
කය නම් නොතිරය අදහා ග න් නේ
පණනම් තණඅග පිණිබිඳු වැ න් නේ
පිණනම් නොපමාවම කරග න්නේ

බුදුවරයින්ගේ බණ නම් අසත්‍ය නොවන් නේය, මේ කයනම් ස්ථිරයයි සිතා අදහා නොගන්නේය. පණනම් තණ අග තිබෙන් නාවූ පිණිබිඳු සමානය, පුණ්‍යකර්මයනම් අප්‍රමා දවම කරගන්නේය.

47

අස න් මෙමා කීදේ වැඩ ඇතිව නා
පස න් සිතින් උන්නත් පව්කරම් නා
උප න් නොතින් මතු යක්බූ පිසසු නා
සසින් ඇවිද පිණකුත් බැරි එපවි නා

අභිවෘධි දායකවූ මා විසින් මේ කියනලද්දාවූ දෙය අසනු, පව්කම් කරමින් ප්‍රසන්නවූ සිතින් සිටියත් මතුකාලයෙහි යක්‍ෂ භූත පිශාචව උපන් නේවිනම් ඒ පාපකර්මයෙන් බඩසයින් ඇවිද පිණක්ද කරගන්නට බැරිවන්නේය.

48

ලොබේ සිතින් පව්කළ සැමසත ටා
ස බේ කියති ගෙණගොස් යමරජු ටා
ඉ බේ ඉන්ට නොයදී සිතුරඟ ටා
ලැ බේ නිරාදුක් පැමිණේ එවි ටා

ලොභ චිත්තයෙන් යුක්තව පව්කළ සෑම සතුන්ම යමරජුගේ සමීපයට ගෙණගොස් සභාවෙහි කියන්නාහුය, එවිට සිත්වූපරිද්දෙන් ඉන්ට නොදී එකල්හි නිරය ලැබ දුක් පැමිණෙන්නේය.

49

තොසින් නොයෙක් සැපවිඳ සමහරු නි ති
ඇ සි න් ම දූක පව්පින් කළවුන් ග ති
බ සි න් කිවත් අදහා පින් නොකර ති
ගොසින් නිරේ වැටුනොත් දුක් හිම්නැ ති

සමහර අය නිතර සතුටින් නොයෙක් සැප විඳ පව් පින් කළවුන්ගේ ගතිය ඇසින්ම දූක වචනයෙන් කීවත් විශ්වාසකොට පින් නොකරති. මියගොස් නිරයෙහි වැටුනේනම් ලැබෙන දුඃඛයාගේ සීමාවක් නැත්තේය.

50

පි න් පව් නොදූනම අනුවනකම්කො ට
කන් නන් මස්රස සොඳමයි කරතු ට
ඉ න් ගැලවෙනු බැරි නොගොසින් නිරය ට
දූ න් එම ආලය අරිනේ අදසි ට

කුශල් හා අකුශල් නොදූනම අඥනකම්කොට මස් රසය යහපත්යයි සන්තොෂකර අනුභව කරන්නාවුනට නිරයට නොගොස් ඒ පාපකම්යෙන් මිදීම නොහැකිය, එබැන් මේ කාලයෙහි අද පටන් ඒ මාංශයෙහි ආලය අත්හරින්නේය.

51

කා ලා රසමුසු බෝජන කරපෙ මි
ගා ලා සුවඳැති සඳුනුත් මනර මි
ලා ලා අබරණ නිසිලෙස සැරසු මි
පා ලා ගියවැනි බහුරූ කෝල මි

ප්‍රෙමකොට රස මිශ්‍ර භොජනය වලඳා මනොරම්‍යවූ සුවඳ ඇති සඳුනුත් ආලෙපකොට ආභරණයන් ශර්රයෙහි දමා නිසිලෙස සැරසීම (කෙසේදයත්?) බහුරූ කෝලම් ප්‍රකාශකොට ගියාක් වැනිය.

52

මෙබස් තම නුවනිම්ම විමසා නොතිරවූ
කය ගති අසන් නේ
දෙතිස් කුණුයෙන් යුතුවූ මදකුත් සාරනූ
බව නැණින් දන් නේ
මි නි ස් බව ලත්තැනේ කුසලක් නොකර
උන්නොත් අපලවන් නේ
ස ති ස් නිරයේ ගොසින් වැටු නොත්
එදසි අනුවනකම් දූනෙන් නේ

මේ වචනයන් තමන්ගේ ඥාණයෙන්ම පරීක්‍ෂාකොට ස්ථිරව නොපවතින්නාවූ ශරීරයෙහි ස්වභාවය අසන්නේය, දෙතිස් කුණපයෙන් යුක්තවූ මදක්වත් සාරනුවූ බව ඥානයෙන් දූනගන්නේය, මේ මිනිස් බව ලැබගත් තැනේදී කුශලයක් නොකොට උන්නේවීනම් නිෂ්ඵල වන්නේය, මෙයින් චුතව ගොස් තිස්සයක් ප්‍රභෙදවූ නරකයෙහි වැටුනේ වීනම් අඥානකම් දූනෙන්නේ එදාටයි.

53

පෙරත් ජාතියෙ පතාගත් දූන් සේතු බල
යෙන් මෙතැන් නේ
ලඟත් වෙන්නොව සමග දවසැර උන්
නුමුත් සෙනෙහසින් නේ
පණත් යනකල තනිව ගෙසිඋන් අයත්
වෙන්වේ බඳින් නේ
පිණුත් කළ නිති කැටුව යෙයි ගියතැ
නේදී සැපවිඳින් නේ

පූර්වජාතියෙහි පතාගත්තාවූ හෙතු බලයෙන් දූන් මේ ස්ථානයෙහි සමීපයෙහිද වෙන්නොවී එකතුව සෙනෙහසින් දවස්ඇර උන්නේ නුමුත් තනිව පණ යන කල්හි ගෘහවාසිඅයත් සෙනහ බන්ධනයෙන් වෙන්වන්නේස, කරණ ලද පිණද නිතර කැටුව යන්නේයි, ගියාවූ ඒ ස්ථානයෙහිදී සැපද විඳින්නේය.

54

සාර නූ කුණු කයක් අරගණ කරණ
බහු නාටක තදේ
නෑර තම හිමි සමග දවසැර උන්නුමුත්
සැප විඳ විදේ
ගෝර මරුවා පැමිණි කල්දූන යන්ට
කැඳවා එම සදේ
බාර වම සිටුවන්ට බැරිවද පිණක් කර
ගත්තොත් සොදේ

සාර නොවූ කුණපයෙන් යුත් ශරීරයක් රැගෙණ දූඩිවූ බොහෝ නැටුම් කරන්නාවූ තමාගේ ස්වාමියා අත්නොහැර එක්ව සැප විඳි

මින් දවස් යවමින් උන්නුමුත් ඒ කාලයෙහි පර ලොවට කැඳවාගෙණ යාම පිණිස රුදුරු මරුවා පැමිණියාවූ කාලය දූන බාරව් හෝ ඇපව් මෙහි නවතාලනට බැරුවාවද? එබැවින් පිණක් කරගත්තොත් යහපති.

55

සරණ මුනිඳුගෙ අදහ පිණකුත් නොකර
ඉන්නේ කුමටදෝ
මරණ පැමිණෙන කලට සමයා ඇවිත්
කැඳවා යන්ටදෝ
කරණ සොඳකම් දන් පිණක්කල කියනු
නුවනින් සොඳවේදෝ
කුමණ අනුවනකම්ද නෑසිනි අඹනු සිටු
වාගන්ටදෝ

මුනිනුයන්වහන්සේගේ සරණ විශ්වාසකොට පිණක් නොකර ඉන්නේ මක්නිසාද? යමයා ඇවිත් මරණය පැමිණෙනකල්හි කැඳවාගෙණ යාමටද? නුවනින් යුක්තව දන් පින් කිරීම යහපත්යයි එහි ගුණ කීම පවා යහපත් කුශල ක්‍රියාවක් නොවේද? නෑයෙනි හැඬීම කුමන අනුවනකමක්ද මැරෙන්ටනොදී වලක්වා ගන්නටද?

56

අඹා ලා කම්පාව උන්නත් ඉතින් දූක්මක්
නොවන්නේ
තනාලා සිත පිණක් නොකරම කිම්ද
උපයා තිබන්නේ
දමා ලා යන නරක කුණු කය කුමටදෝ
සැප විඳින්නේ
දිනා ලා මොක් පුරට යන්නට මකී මේ
බණ අසන්නේ

අඬා වකිතව් උන්නුමුත් දූන් ඉතින් දූකී මක් නොවන්නේය, සිත දමනයකොට කුශල කර්මයක් නොකරම උපදවා තබන්නේ මොන වාද, දමාලා යන කුණු ශරීරය සැප විඳින්නේ කුමටද? කෙලෙසුන්ගෙන් ජය ගෙණ නිවන් පුරයට යාම පිණිස මවිසින් කියන ලද්දාවූ මේ ධර්මය අසන්නේය.

57.

සි ටි න ඇමිණ ගෙණ මෙසසර බි ලි යේ
වි ඳි න මෙදුක් ජරයෙන් තැළි තැ ලි යේ
ද කි න නැටුම් වැනි විදුලිය එ ලි යේ
මෙදූන නොකර කුසලට කම්මැ ලි යේ

මෙ සසර නැමති බිලීකටුවෙහි ඇමිණීගෙණ සිටින්නාවූ ජරාවෙන් තැළි තැළි විඳින්නාවූ මේ (මෝහයෙන් සැපයයි සලකන්නාවූ) දුක කෙබ ඳුද? විදුලි එලියෙහිදී දකින්නාවූ නෘත්‍යයක් සමානය, මේ ස්වභාවය දූන කුශලට කම්මැලි නොකරව.

58

ද න් පින් බැරිදේකැයි නොසිත න් නේ
අ න් කළ පින් අනුමෝදන් ව න් නේ
උ න් කළ පින් සරි පින් ලැබග න් නේ
ඉ න් වද සගමොක් සැප සාද න් නේ

දන් පින් කිරිම දුෂ්කර දෙයක්යයි නොසිතන් නේය, අනුන් විසින් කළ කුසල් සතුටු සිතින් අනුමෝදන් වන්නේය, එයින් ඒ කුශල කර්මය කළ උන්ගේ පිණට සමානවූ පිණක් ලබාගන් නේය. ඒ අනුමෝදන්වූ කුශලයෙනුත් ස්වර්ග මොක්ෂ සැප සිඩකරගන්නවාවද?

59

ස ය ට  වේද රසමුසු බත් ක  න් නේ
ග ඳ ට  වේද ඇඟ සුවඳ කර  න් නේ
ලෙඩට  බේති මේ මෙලොව සතු  න් නේ
කු ම ට  මීට සැපයකැයි සිත  න් නේ

රස මිශ්‍රවූ ආහාර අනුභවකරන්නේ බඩ ගින්නට නොවේද? ශරීරය සුවඳකරන්නේ දුර්ගන්ධයට නොවේද? මේ ලොකයෙහි සත්වයන්ගේ ලෙඩට මේ බේත්ය, එබැවින් මීට සැපයක්යයි සිතන්නේ මන්ද?

60

මා නෙ න්  ඉදිතත් මේ සැප පෙරැ  ම ය
සී නෙ න්  ගෑ සුවඳක්සේ බොරු  ම ය
දා නෙ න්  සීලෙන් නොකළොත් දරු  ම ය
පා නෙ න්  අඳුරට ගෙණයයි කරු  ම ය

මේ සැපය පරම ශ්‍රේෂ්ඨයයි සලකා මාන්නයෙන් ඉදිනේ තුමුත් සීනෙන් ගානලද්දවූ සුවදක් මෙන් බොරුමැයි, දානයෙන් හා සීලයෙන් ධර්මය සම්පූර්ණ නොකළේනම් කර්මයතෙම සත්වයා ආලොකයෙන් අපාය නමැති අන්ධකාරයට ගෙණයන්නේය.

61

ද ර රැ ස  ගිනි ඇවිළුනු කල නිබ  දේ
ගිනි මි ස  දරයයි යන බස නොයෙ  දේ
එම ලෙස  එක්කොට වදහළ මුනි  දේ
දු ක් මි ස  කයකැයි යනබස නොයෙ  දේ

දර රාශියක් එකට ගිනිගත් කල්හි ගින්නයයි කියනු මිසක් දරයයි යන වචනය නොයෙදෙන්නේය, එලෙසම සර්වඥයන්වහන්සේ විසින් වදාළ බස හා එක්කොට බලන කල්හි දුකම මිසක් ශරීරය යන වචනය යෙදියයුතු නොවේ.

62

ඉ දි තො ත් බෝකල් ජරයෙන් විසි රේ
නැතහොත් වැදයසි මරුමුව කුහ රේ
මෙ ම හ ත් ජරමර දෙදෙනා අත රේ
මෙ සැ ප ත් සැපයසි ගනිද්‍ද කව රේ

බොහෝ කාලයක් ජීවත්ව ඉන්නේනම් ජරාවෙන් දිරා විසිරියන්නේය, එසේ නැතහොත් මරුවාගේ මුඛනැමති කුහරයෙහි ප්‍රවිෂ්ටවියන්නේය, මහත්වූ මේ ජරා මරණ දෙදෙනා අතුරෙහි මේ අස්ථිර සැපය සැපයක්යයි කවරෙක් ගණිද්ද? නොගණිමැයි.

63

අ ස ල් ගේක සොරකම් ගිය දවස කා
කු හු ල් සිතින් ඉදිනේ තම ගේ රැ කා
සි ය ල් සතුන් මරු ගෙණයනවා දු කා
කුස ල් නොකර ඉදිනේ ඇයි නොවසැ කා

සමීප ගෙයක සොරකම් ගිය දවසෙක්හි සැකසිතින් තමාගේ ගෙය රැකගණ ඉන්නේය, සකල සත්‍වයන්ම මරුවා ගෙණයනවා දක නිසැකව කුශල කර්‍මයන් නොකොට හිදින්නේ මන්ද?

64

ගඟ යන ඇත්කුණ ඉඳ මස් රස වා
සිදුමැද වැද වැනසුනු මෙන් කපු වා
ලද ඉසුරෙහි ලොබකලහොත් තොප වා
බව සයුරෙන් ගමනෙක් නැත ගොඩ වා

මාංසයෙහි රසය පිණිස ගඟෙහි පාවීයන්නාවූ ඇත් කුණේ හිඳ කවුඩා සමුද්‍රයට වැදී නැසුනාක්මෙන් තමන් ලත් සැපතෙහි ලොභ කෙලේනම් තොපට සංසාරසාගරයෙන් ගොඩට යාමක් (සසරින් එතරවීමක්) නැත්තේය.

65

ප ර සතුරන් එති එති යන බස ටා
ඇ ර අඹුදරුවන් යන තොපි වල ටා
ඝොර ජර මරු එනු එනුදූක වෙත ටා
ප ර මාදව ඉන්නේ ඇසි පිණ ටා

පරසතුරෝ එන්නෝය එන්නෝය යන වචනය අසා අඹුදරුවන් අත්හැර වනානතරයට යන්නාවූ තොපි ඝොරවූ ජරාව මරණය සමීපයට එනවා බල බලා පිණට ප්‍රමාදව ඉන්නේ මක්නිසාද?

66

ග ඟ චතුරෙහි යන මිනිසෙකු දුකි නේ
ල ඟ කළ ඔරුවට නොනැගෙණ ලෙසි නේ
ස ග මොක් දෙන බණ අදහා නොගෙ නේ
දු ග තිය වැද තොපි කිම දුක් විදි නේ

ගංගාජලයෙහි වැටී දුකින් ගසාගෙණ යන්නාවූ මිනිසෙක්තෙම ලංකළාවූ ඔරුවට නොනැගෙන්නාක්මෙන් ස්වර්ගමෝක්ෂය දෙන්නාවූ සද්ධර්මය අදහා නොගෙණ තොපි දුගතියට වැදී විදින්නේ කිම්ද?

67

ස් ල් ප නැවුම් සේවාකම් පා ත ද
අ ල් ප දෙයක් උදෙසා විදිනා ව ද
සි ල් ප හඳු රැක්කෝතින් තතුලෙ ද
ක ල් ප දහස් සුර සිරි විඳිනේ ව ද

දුනු ශිල්ප ආදී සිල්පද නැවුම්ද දරුණුවූ සේවාකම්ද ප්‍රකාශකොට ස්වල්පදෙයක් නිසා සතුන් විදින්නාවූ වධය බලා ඇතිසැටි සිල් පිරිසිදු කොට රක්ෂාකෙළේනම් කල්ප දහස් ගණනක් මුලුල්ලෙහි දිව්‍ය ඓශ්වර්ය විදින්නේවද.

68

උන්නත් නැගි සිපිනට බැරි තී රු ව
සිපියත් ඉඳිනට බලනැති සී රු ව
ජරපත් වූ කල නොතිබෙයි මේ රු ව
කරතොත් කරගන් දන්පින් සී රු ව

හිඳගණ උන්නත් ශරීරව නැග් සිපින්ට බැරිවූ සිපියත් සීරුවෙන් හිඳින්නට ශක්තිය නැත්තාවූ ජරාවට පැමිණි කල්හි මේ රූපය නොතිබෙන්නේය. එබැවින් කරතොත් දන්පින් සීරුවෙන් කරගනු.

69

මුන් හැම අඹුදරුවන් උපදි න් නේ
පින් බලයෙන් බෝකල් පවති න් නේ
උන් කල පිණිමය උන් රඳව න් නේ
ඉන් සිත ලොබමය තොප පවති න් නේ

මේ සියලුම අඹුදරුවන් උපදින්නෙත්, බොහෝකල් පවතින්නෙත් පින්බලය කරණ කොටගෙණය. කාලයක් මෙහි ඔවුන් රඳවන්නේනම් ඔවුන්කල පිණිමය, එසේ හෙයින් තොප සිත පවතින්නේ නම් ලොභයමයි.

70

සී ල ගුණේ පිහිටාගණ නොයි දේ
ආ ල ය කර රකිනා තොප නිබ දේ
බා ල පියඹු දරුවෝනම් මෙස දේ
බා ල කලට කෙළිනා උතුවල දේ

ශීල ගුණයෙක්හි පිහිටා නොඉඳ තොප විසින් නිතර ආලයකර රකින්නාවූ මේ කාලයෙහි ලද රුවූද ප්‍රියවූද අඹුදරුවෝනම් බාල අවස්ථාවෙහි කෙළිනාවූ උතුවලන් ( පොල්කටු ) වැනිය.

71

දු ක් ගෙණ රැස්කල දන හැම කැම ති
නි ක් මෙන නිරයට නරයින් සිරි ති
දු ක් දෙන අඹුදරුවන් නිති රකි ති
මොක් දෙන පිරිසිදු සිල් නොම රකි ති

දුක්ගෙණ කැමතිවූ සියලු ධනය රැස්කිරීම නිරයට පිටත්ව යන්නාවූ මනුෂ්‍යයින්ගේ චාරිත්‍රයෙකි. දුක් ගෙණදෙන්නාවූ අඹුදරුවන් නිරතුරුව රක්‍ෂාකරන්නාහුය. මොක්‍ෂ සැපත දෙන්නාවූ පිරිසිදු ශීලයන් රක්‍ෂානොකරන්නාහුය.

72

නොලදත් අහරක් සාදුක් දුරුකො ට
නැතුවත් කඩරෙද්දක් එකපටක ට
බ ල ව ත් නිරයේ තදදුක් සිහිකො ට
ම ද කු ත් පසුනොබසිව් තොපි පිණක ට

බඩගිනි දුක දුරුකර ගැණීමට ආහාරයක් නොලැබුයේ නුමුත්, තන් පොටකටවත් ඇඳ ගැණීමට රෙදිකඩක් නැත්තේවී නමුත් නරකයෙහි ඇති බලවත්වූ තද දුක් සිහිකොට තොපි කුසලයට මදක්වත් පසුබට නොවව්.

73

නස තොත් සිත ලොබ අනුවන දෙ ස ම ය
ව ස තො ත් සැදැහැත්තන් ඇති දෙ ස ම ය
දෙසතොත් සගමොක් දෙන උපදෙ ස ම් ය
අ ස තො ත් මුනිඳුන් වදහල බ ස ම ය

නසතොත් සිත පිළිබඳ ලොභය මොහය ද්වෙෂය යන මොව්හුය. වාසය කරත්හොත් ශ්‍රද්ධාවතුන් ඇත්තාවූ දෙශයෙහිමය. දෙශනා කරතොත් ස්වර්ග්මොක්‍ෂ සැප දෙන්නාවූ උප දෙශයමය. ශ්‍රවණය කරතොත් මුනීන්ද්‍රයන් වහන්සේ වදාළ ධර්මයමැයි.

74

වැ ණු වා න ම් බුදුගුණ වැ ණු වා ම ය
තැ නු වා න ම් තම්සිත තැ නු වා ම ය
දෙ නු වා න ම් දන්පින් දෙ නු වා ම ය
දි නු වා න ම් පරලොව දි නු වා ම ය

වණීනා කෙලේනම් බුදුගුණ වණීනා කිරීම මය. තැනුයේනම් තමාගේ සිත පාපයෙන් තොර කොට තැනීමමය. ඉපදවූයේනම් දාන ශීලාදි පින් ඉපදවීමය. ජයග්‍රහණය කෙලේනම් පර ලොව ජයග්‍රහණය කිරීමමය.

75

අ ස තොත් නිබොරුව මුනිඳු තෙපු ල් ම ය
හ රි තොත් නොතබා දස අකුස ල් ම ය
ර කි තොත් සිත පිරිසිදුකොට සි ල් ම ය
ද නි තොත් මෙසියල්ලට මේ කා ල් ම ය

අසතොත් බොරු නැති සර්වඥ වචනයමය, ඉතුරු නොකොට දුරුකරතොත් දශ අකුශල් මය, රක්‍ෂාකරතොත් සිත පිරිසිදුකොට සිල් රැකීමමය, දන්නේනම් මේ සියල්ලටම මේ බුඩොත්පාද කාලයමය.

76

මෙ ස සර දුක් රුක විස පලගත් අ තු
ලෙ ස ස්ටියාමෙන් සිය පලයෙන් යු තු
තොස වඩමින් ඉන් බැහැර නොලා සි තු
ද ස අකුසල් පල අසව මෙසින් ම තු

මේ සසර දුක් නැමති වෘක්‍ෂයෙහි විෂපල හට ගත්තාවූ සියගණන් පලවලින් යුක්තව ශාඛාවල ආකාරයෙන් සිටියාක්මෙන් (දශ අකුශල ඵලය කියමු.) එයින් සිත බැහැර නොදමා සන්තොෂ වර්ධනය කරමින් දශ අකුශලයන්ගේ අනිෂ්ට විපාකය මෙසින් මතු අසව.

77

බුදු බණ අසමින් සිතසත පායේ
කුරුපණ කම් ඇරපිය ඒ පායේ
පරපණ නැසුවොත් කවර උ පායේ
අපමණ දුක් දෙයි සතර අ පායේ

බුදු බණ ශ්‍රවණය කරමින් සිත සංසිඳුවා සර්‍වඥයන්වහන්සේ විසින් එපාකලාවූ කෲරවූ ප්‍රාණඝාත කර්‍මය හැරපියනු. කවර උපායකින් හෝ ප්‍රයොගයකින් නුමුත් පරපණ නැසුයේවීනම් සතර අපායෙහි අප්‍රමාණ දුක් ලැබෙයි.

78

මැඩියන් නයි මුව ගොදුරුව ඉඳ යා
පණුවන් කනමෙන් රසවිඳ විඳ යා
සැලෙමින් ජරගොර මරුමුව වැද යා
බලමුන් පරපණ වනසන ලෙද යා

මණ්ඩූකයන් නාගයින්ගේ මුඛයට ගොදුරුව ඉඳ රස විඳ විඳ ( රස බල බලා ) පණුවන් කන් නාක්මෙන් ජරාවට හා ඝොරවූ මරු මුඛයට වැදී කම්පාවෙමින් මේකලා අනුන්ගේ ප්‍රාණ විනාශකරන්නාවූ හැටි බලව!

79

බලයෙන් වත් කිසියම් සොර සිත කින්
සියතින් වත් දුන්වූ උපදෙස කින්
පරසන් තක දෙය ගත සොරකම කින්
තිරයෙන් නිරයට පැමිණෙසි එත කින්

බලහත්කාරකම් කිරීමෙන්වත් යම්කිසි සොර සිතකින් තමාගේ අතින්වත් අනුන්ට දන්වන ලද්දාවූ උපදෙශයකින්වත් අනුන් අයිති කිසියම් දෙයක් සොරකමින් ගත්තේවීනම් එම පාප කර්‍මයෙන් නරකයෙන් නරකයට පැමිණෙන්නේය.

80

ලොබිනා නොමිහිරි සොරකම් කළ ස ත
වි දි නා දුක් මේ ලොව මෙතෙකැයි නැ ත
මෙ දි නා ඒ දැක දැක ඉන් නොනැව ත
ඉ දි නා කල කිකලක වේදෝ සෙ ත

අන්සතු දන ලොභයෙන් අමනොඥවූ සොර කම් කළ සත්‍වයන් විසින් මේ මනුෂ්‍යලොකයෙහි විඳින්නාවූ දුක් මෙපමණයයි ගණන් නැත්තේය. මේ කාලයෙහි ඒ චෞර ක්‍රියාවෙන් එම් සොරුන්ට ලැබෙන්නාවූ දුක් දැක දැකත් එයින් නොවැලකී හිඳිනා කල්හි සානතියක් කවර කාලයෙක්හි වේදෝ! නොවේමැයි.

81

අසු කොට ගත නොතබති ආදා ර ය
ව ද කොට මැරුවත් නැත එව්චා ර ය
ලඝුකොට නොසිතව් පව් පරදා ර ය
නි ර ය ට ඇදගණියයි එම වා ර ය

පරදාරය කළ අයෙක් අසුකරගත්තේවිනම් ඔහුගේ ආධාරයක් නොතිබන්නේය, වධ දී මැරූයේවිනුමුත් ඒ ගැණ විචාරිමක් නැත්තේය, පරදාර පාපකර්‍මය සැහැල්ලුකොට නොම සිතව්, කාම මිථ්‍යාචාරයෙහි හැසුරුණු කල්හි ඌ නිර යට ඇදගණ යන්නේය.

82

අ සවා මකියන බස් අරත ර යේ
මු සවා බස් කීවා එක මු ර යේ
ව සවා දෙව්ලොව යන මන්ත ර යේ
පැසවා මිස නාරි ගොස් නි ර යේ

ඎිරිව මා විසින් කියන්නාවූ වචන අසාවා. එක වරක් මුසාබස් කීයේනම් දෙව්ලොවට යන්නාවූ මාර්‍ගයන් තදකොට වස්සවා නිරයට ගොසින් පැසවා මිසක් නොහරින්නේය.

83

පලදෙන පව් පින් දෙක නොබ ලා මේ
පවසන බස් උරසක් මා ලා මේ
ඕඳුවන බස් වැඩ නැති කෝ ලා මේ
මතුවන දුක් නොදනෙන වේ ලා මේ

විපාක දෙන්නාවූ පව්පින් දෙක නොබලාම උරචකුමාලාවක් වැනිවූ දෙලොවට වැඩක්නැති ඔඩුනොවුන් භෙදකරවන වචනය කෝලාම නම් වේ. අනාගතයෙහි වන්නාවූ දුක් නොදනෙන් නාවූ මේ කාලයයි.

84

අවිස නොවන බස් කණට යවුල් ලෙ ස
සිත ස තොසින් කිය කියතොත් පියබ ස
පරුස තෙපුල් බිණුවානම් මහදෙ ස
එවිස නොයයි පරලොව දුක්දී මි ස

විෂවූ පරුෂ වචන කණට යකඩ උල් වැනිය, එබැවින් කියතොත් ප්‍රිය වචනය සතුටු සිතින් කියව, පරුෂ වචනකීයේනම් ඒ මහා දෙෂ යකි, ඒ විෂය (ඒ පරුෂ වචනය) පරලොව දුක්දී මිසක් ගෙවී නොයන්නේය.

85

පෙරසිට වියතුන් නොකියා වැල කී
දෙලොවට වැඩනැති බස් අකුසල කී
කෙළියට වත් ඒ වැඩනැති බස කී
නිරයට වැදයන රජමහවත කී

පෙර පටන් ව්‍යක්තයන් විසින් නොකියා වැල කූනාවූ මෙලොව පරලොව දෙකටම, පලක් නැත්තාවූ සම්ප්‍රලාප කීම අකුශලයක් වන්නේය, සෙල්ලම් පිණිසවත් ඒ අවැඩදයක වචන කීම නරකයට ප්‍රවිෂ්ඨවන්නාවූ රාජ මහා මාර්ගයකි.

86

අන් සතු සැපතක් දැක දල ලොබී නේ
උන් ට නොවීමට වේවයි සිති නේ
මන් කළ ඒ සිත අටගත් පවි නේ
උන් මතු නිරයේ දුක්මයි විඳි නේ

අනුන් අයත් සම්පත්තියක් දැක දැඩි ලොභයෙන් උන්ට නොවී තමාට වේවයි සිතින් මෙනෙහි කෙළේනම් සිතෙහි හටගත්තාවූ ඒ පාපකර්මයෙන් අනාගත කාලයෙහි ඔවුන් නිරයෙහි විඳිනු ලබන්නේ දුක්මය.

87

රිසි නූ දනහට කර වාදේයා
නසි වයි යන සිත වැ පාදේයා
බසි නා නිරයට ඒ පාදේයා
කිසි කලකත් ඒ ඒ පාදේයා

තමාට රුචි නොවන්නාවූ ජනයාහට වාද කොට නසීවයි කියා සිතන සිත ව්‍යාපාදය නම් වේ, ඒ ව්‍යාපාද කර්මය නරකයට බස්නාවූ පාදයක්ය, එබැවින් ඒ ව්‍යාපාදය කවරකලකවත් එපාදෙයක්මය. (නොසිතිය යුතුමය.)

88

නිර්වණට මග මේයයි මුනි කී යම්
දහමට වෙන්වූ දෙසැටක් සම යම්
සරිකොට ගත් සිත වෙයි මිසදිටු යම්
සසරට බිජුවටමයි ඒ සම යම්

නිර්වණට යන ආර්ය මාර්ගය මෙයයි බුදුරජානන් වහන්සේ විසින් වදාරණ ලද ධර්මයකට වෙනස්වූ දෙසැටක් දෘෂ්ටි සත්‍යකොට ගන්නා ලද්දාවූ යම් ඒ සිතක් වේද එය මිථ්‍යාදෘෂ්ටි නම් වන්නේය, ඒ ලබ්ධිය (දුක් ඇතිකරවන බැවින්) සසරට බිජුවටක්මය.

89

නට සිල් මිසදිටු ගත්අය කැම තී
අ ට ගත් කප් ගිනිකඳ මැද පැසෙ ති
අ ට මහ නරකය පැසුනත් නොමැ තී
පි ට සක්වල එක් පෙදෙසක පැසෙ තී

දුශ්ශීලවූ සිය කැමැත්තෙන් මිථ්‍යා දෘෂ්ටි ගත්තෝ ඇවිලී ගත්තාවූ කල්පාන්තයෙහි හට ගන්නා ගිනි මැද දැවෙන්නාහුය, අටමහනරක යෙහි පැසුනේ වී නමුත් දුක් විඳීම ඇතිනොවී පිටසක්වලක එක් ප්‍රදෙශයෙක්හිද පැසෙන්නා හුය, (ඒ පිටසක්වලවල් විනාශවන කල්හි අහ සෙහි එක් තැනක පැසෙති.)

30

තෙ සි ය ක් තෙප්මුව වැද සිදුරුව ග ත
ද ව ස ක් මිනිසෙකු විඳී දුක් නොනැව ත
මොහොතක් නිරයේ විදි දුක් සමව ත
අ බැ ට ක් හා සරිවේද්‍යෙ හිමව ත

තෙප්මුව (ලංස උල්) තුන්සියයක් ඇනී ශරී රය සිදුරුවී මනුෂ්‍යයෙකු නොනැවතී දවසක් විඳි දුක් නරකයෙහි මොහොතක් වින්දවූ දුකට සමාන වන්නේනම් හිමාලය පර්‍වතය අබ ඇට යක් හා සමානවෙයි නොවේද්‍යෙ!

91

නොයෙකී රසකිම නිඹබිජු වටල ත
එ මැ කී සිපිනෙය තිත්තව පලග ත
මෙ ම කී මිසදිටු අදහස් ඇති ස ත
ක ල කී දෙය අකුසලම්ස පින්නැ ත

නොයෙක් රස පෝර ඇත්තාවූ භූමියෙහි කොසඹ ඇටයක් රොපනය කළ විට පලගත් කල්හි ඒ රසගුණය නැතිවී තිකතරසවී සිපින්

නේය, මේ කියනලද මිථ්‍යාදෘෂ්ටි අදහස් ඇත්තාවූ සත්ත්වයන් විසින් කරණ කියනලද දෙයෙහි අකුසල් මිසක් පිණක් නැත්තේය.

92

කර දර දස අකුසලයෙන් නොමි දී
වැරසැර පෑවොත් මෙමිනිස්ලොව දී
මෙරගිර මුදුනෙන් හුනුමෙන් නොරැ දී
පරතෙර නැති දුක් සයුරේ කිමි දී

කරදරයදෙන දශඅකුශලයන්ගෙන් නොමිදී මේ මනුෂ්‍යලොකයෙහිදී වැරසැරකම් පෑයේ නම් මහාමේරු මස්තකයෙන් නොනැවතී වැටුනාක්මෙන් පරතෙරක් නැත්තාවූ දුක් සමුදුරෙහි ගැලෙසි.

93

බුදු වත් මෙතෙකැයි නොකිහැකි පිරිසි ඳ
බලවත් මහදුක් විඳුවන හැමස ඳ
සිතුවත් බියවන අටමහ නිරය ඳ
ඔසුපත් සහ එක්සිය සතිසක්ව ඳ

බුදුවීවත් මෙපමණයයි නියමකොට කියන්නට නොහැක්කාවූ බලවත්වූ මහත්දුක් සෑම කල්හි විඳුවන්නාවූ සිතුයේ නුමුත් බිය එලවන්නාවූ අටමහා නරකයද ඔසුපත් නරකයන් හා සමග එකසිය තිස්සයක් වන්නේය.

94

මේ ද ස අකුසල් ඉනෙකක් කළහො ත්
උපදෙස කින් බසකින් කරවූවො ත්
එවිගස එක් අදහස සිත සිතුවො ත්
නො නෑ වත මොහු හැමදෙන නිරයට යෙත්

මේ කියන ලද්දේ දශඅකුශලයයි, එයින් එකක්වත් තෙමේම කෙලේනම්ද උපදෙශය කින් බසින් අනුන් ලවා කරවූයේද එකෙණෙහි සිත පිළිබඳ එකම අදහස සිතුවහොත් මොව්හු සැමදෙනා මෙහි නොනැවතී නරකයට යන්නා හුය.

95

පෙර අඟ නෙක් එක් එළුදෙනෙකු ඉසසි ඳ
සියලඟ වැලඳී ගිනිදූල් නිරය දුක්වි ඳ
ඇඟඇඟ ලෝම ගණනේ ඉස් කැපුන්ල ද
මෙමරඟ වේය කාටත් අකුසලේ ලෙ ද

අතීතයෙහි එක ස්ත්‍රියක් තොමෝ එක එළු දෙනෙකගේ හිස කපා සකල ශරීරයෙහි වැල දෙන ලද ගිනිදූල්වලින් යුක්තව නිරයෙහි දුක් විඳ පසුව ඒ එළුදෙනගේ රෝම ගණනාවෙන් හිස්කැපීම ලැබූවාය, එබැවින් කවරෙකුට වුවත් අකුශල කර්මයෙහි සැටිය මෙම ආකාරම වන් නේය.

96

කෙළි යට කඩක් සඟවා යහලුවෙකුගෙ නේ
එ ලි කොට නැවත දුන් මිනිසෙකුට මෙතෙකි
වි ලි වැස්මක් නොලදිය දෙවිඋනත් අ නේ
කෙළි යටවත් නොකරව් සොරකමක් දූ නේ

කෙළි පිණිස යහලුවෙකුගේ වස්ත්‍රයක් සඟවා පසුව එලියට ගෙණවුත් දුන්නාවූ මනුෂ්‍යයෙකුට දෙවතාවෙක්ව උපන් කාලයෙහි පවා අහෝ විලිවැසීමකට පමණවූද වස්ත්‍රයක් නොලැබු නේය, මෙය දූනගෙණ ක්‍රීඩා පිණිසවත් සොර කමක් නොකරව්.

97

නොනැවතී අයෙක් පෙර පරදර පව් කැමතී
ගු ගු ර තී ගැලෙතී තිස්වාදහසින් උඩෙ තී
ඝිම් නැ තී තවම ලෝකුඹු නිරයේ පැසෙ තී
නොක රතී මෙපව් නුවනැතිඅය වැඩ කැමතී

පූර්වයෙහි පරදාර කර්මය කැමතිව එයින් වෙන් නොවූ සමහර අය ලොහොකුඹු නරකයක වැටීගර්ජනා කරති, තිස්වාදහසකින් ගිලෙත් උඩඑත් ක්ෂීමාවක් නැත්තාවූ ඒ ලොහොකුඹු නිරයෙහි අද දක්වාත් පැසෙන්නෝය. එබැවින් තම හට දෙලෝ වැඩ කැමති ප්‍රාඥයෝ මේ පව් නොකරත්.

98

ලැ දි ව රජෙක් බොරු බස්කී විගස ක යා
නැ ති ව රිද්දි බලයත් ඒ මිනිස් ක යා
පොළොව පලාගණගොස් වැටුනී නර ක යා
මෙ ලොව සතුනි ඉන් බොරුකීම නර ක යා

චෙතිය නම් රජෙක්තෙම මුසාවාදයට ලැදිව බොරු වචන කී විගසින්ම ඍද්ධි බලයත් නැතිවී ඒ මනුෂ්‍ය කයෙන්ම පොළොව පලාගෙණ ගොසින් නරකයෙහි වැටුනෝය, එහෙයින් මේ ලොකවාසී සත්වයෙනි බොරුකීම නරකයි.

99

පි සු ණු කියා සඟ දෙනමක් වෙනස්කො ට
පැසු නු එකෙක් නිරයේ කල්පයක් සි ට
මු හු නු කුණුව තවපේතව විදි ගැහැ ට
පි සු ණු බසක් නොකියව් අදපටන් සි ට

එකෙක්තෙම ප්‍රිය බව සුන්කරණ කෝලාම් කියා සඞ්ඝයා දෙනමක් භෙදකොට නිරයෙහි කල්පයක් මුලුල්ලෙහි සිට පැසුනෝය, එයින්

මිදී මුඛය කුණුවී ප්‍රෙතයෙක්ව අද දක්වාත් ගැහැට (හිරිහැර) විඳින්නේය, එබැවින් අද පටන් පෛශුන්‍ය වචනයක් නොකියව්.

100

පෙ ර  එක් සඟෙක් සඟගණහට බැන නපුරු
නි ර  යේ වැටී බිම සත්ගවු වැඩෙන තු රු
ඝොර  දුක් විඳි තව ප්‍රේතව සිට කුරි  රු
ප ර  හට එසින් නොකියව් බස් නොපියකරු

අතීතයෙහි එක් සඟනාමක් සඞ්ඝ සමූහයකට නපුරුකොට පරුෂ බැණ නිරයෙහි වැටී බිම සත්ගවුවක් වැඩෙනතෙක් දුක්විඳ නැවත ප්‍රේතව සිට ඝොරවූ ක්‍රෲරවූ දුක් තවම විඳින්නේය, එබැවින් අන්‍යයාට ප්‍රිය නොකරන්නාවූ බස් නොකියව්.

101

කිවොත් වැඩක් නැතිබස් බොරු නිරා ගැ  බේ
ම හ ත් කුරිරු දුක්විඳ යලි අවොත් මො  බේ
කි ව ත් සැබෑ නොගනිති ඔහුගෙ බස් ස  බේ
ගෙ ව ත් සසරදුක් මෙම නොකියතොත් සැබේ

ඵලයක් නැත්තාවූ බොරු බස් කීයේනම් නිරය තුල මහත් කුරිරු දුක්විඳ නැවත මේ ලොකයට ආයේනම් ඔහුගේ වචන සභාවෙහි කිවහොත් සත්‍යයයි පිළිනොගන්නාහුය, මේ අනිටු විපාක ඇති මුසාවාද නොකියන්නාහුනම් සත්‍ය වශයෙන්ම ඔව්හු සසර දුක් ගෙවන්නාහුය.

102

අ න්  සතු දෙය වේවයි සිතු තමහ  ට
ඉ න්  දුගතිය දුක් විඳ අව මෙලොව  ට
උ න්  සිතුවක් සිදුනොමවෙයි එලෙස  ට
මි න්  මතු එසිතක් නොසිතව් පවක  ට

අනුන් සන්තක දෙය තමාහට වේවායයි අභිධ්‍යා වශයෙන් සිතූ ඒ පාපයෙන් දුගතියෙහි දුක් අනුභවකොට එයින් මිදී මේ මනුෂ්‍ය ලොකයට ආයේනම් උන් විසින් සිතනලද්දක් ඒ ආකාරයට සිඩ නොවන්නේය, එබැවින් මෙයින් මතු එබඳු සිතක් පාපයකට නොසිතුව මැනවි.

103

බෝවා දහස් පැසවන නිරය වෙන වෙ න
වෙහෙසා දනන් රූදුවන බය නපුරු ව න
අපාය දුක් විඳුවන උපනුපන් තැ න
ව්‍යාපාදයක් නොසිතව දූන දූන සිති න

නරකයෙහි බොහෝ අවුරුදු දහස් ගණන් වෙන වෙනම පැසවන්නාවූ ජනයන් වෙහෙස කොට රෞද්‍රවන්නාවූ බියවන්නාවූ උපනුපන් තන්හි අපායෙහි දුක්විඳුවන්නාවූ ව්‍යාපාදයක් දූන දූන සිතින් නොසිතව්.

104

කලක් නිරාදුක් විඳ විටෙක ගොඩදු වූ
නොයෙක් රෝග අටගෙණ ගතවෙයි අරි වූ
උදක් නුවණ නැතිවේ සිත වෙයි කිලි වූ
මෙවක් පටන් පව් නොමසිතනු මිසදි වූ

දීඝිකාලයක් නරකයෙහි දුක්විඳ ගොඩක් දුටු කල්හි (මනුෂ්‍යාත්මයක් ලැබ) නොයෙක් රෝග හටගෙණ ශරීරය අරිෂ්ට වන්නේය, උදක්ම නුවන නැතිවේ, සිත අපිරිසිදු වන්නේය, අද පටන් මිථ්‍යාදෘෂ්ටි පාපයක් නොසිතව.

105

බවයෙන් බවයෙහි කෙලෙසුන් නොයෙ කී
නොපදූන් විඳිනා දුක් දූන නිසැ කී
සසරින් ගොඩනැගුමට මුනිඳුන් කී
ලෙස පින් පවසම් ඇසුවොත් යෙහෙ කී

ජාතියෙන් ජාතියෙහි නොයෙක් කෙලෙසුන් කරණකොටගෙණ තොප මේ කාලයෙහි විඳින් නාවූ දුඃඛයන් නිසැකව අවබොධකොට බුදුරජානන් වහන්සේ විසින් සතුන් සසර්න් ගොඩ දැමීමට දෙශනා කළ සැටියෙන් පුණ්‍යකර්මයන් ප්‍රකාශ කරමි. ඇසුවහොත් යහපති.

106

අ න් හට අලසව නොකොට වි · දෑ න ය
පි න් මිස අනිකක් නොකොට ප · දෑ න ය
තුන් සිත පිරිසිදුකොට දුන දෑ න ය
උ න් ගිය ගියතැන ලැබෙසි නි දෑ න ය

කම්මැලිව අනුන්ට විධාන නොකොට පින් මිසක් අන්කිසිවක් ප්‍රධානකොට නොගෙණ තුන් සිත පිරිසිදුකොට දෑන දුනහොත් උන් ගිය ගිය තැන්හි අනුගාමික නිධානය ලැබෙන් නේය.

107

ඇතු ලට වැදගණ ඇවිලෙත ගි න් නේ
පිට තට හළ බඩුමය වැඩ ව න් නේ
මෙසිතට ගෙණ ලොබනොව දන්දෙ න් නේ
තම හට එමවද මතු පලදෙ න් නේ

ගෙයක් තුලට ගිනි වැදගෙණ ඇවිලී දන කල්හි ගෙසින් පිටතට හැරගන්නා ලද්දෑවූ බඩු පමණක් ප්‍රයොජන වන්නේය, මෙම කාරණය සිතටගෙණ ලොභනොවී දෑනය දෙන්නේය, තමාට අනාගත කාලයෙහි විපාක දෙන්නේ ඒ දෑනමය කුශලකර්මයවද?

108

පි න් නොකරණ දුදනන් බස්නා දෑ
තු න් දෙස් මල දුරුකර සිතපා දෑ
ප න් සිල් නිති අටසිල් රැක පෝ දෑ
ඉ න් මොක්පුර පැමිණෙව් නොවබා දෑ

පින් නොකරන්නාවූ දුර්ජනයන්ගේ බස් නොඅ ඇසා ලොභ ද්වෙෂ මොහ යන ත්‍රිවිධ දොෂ මුල් දුරිගූතකොට සිත ප්‍රසන්නකොට නිතර පංච ශීලයද පෝහෝ දවස්හි අෂ්ටාඞ්ග ශීලයද රක්‍ෂාකොට ඒ කුශල කර්මයෙන් බාධාවක් නොවී නිවන් පුරයට ප්‍රවිෂ්ටවව්.

109

ලොල් සිත මුල්සිඳ නිතිතැති සිති නේ
ස් ල් පහදූ රැක සඳරැස් ලෙසි නේ
ච ල් රකිනා සෙමෙරෙකුමෙන් තැති නේ
කා ල් නොයවා සෙද මොක් සිරි ලබ නේ

ලොභ චිත්තය මූලොච්ඡේදනයකොට නිර තුරුව වීය්‍ය්‍යීයෙන් වාලධිය රක්‍ෂාකරන්නාවූ සෙමෙර මුවෙකු මෙන් උත්සාහයෙන් සඳරැස් ලෙසින් සිල් ප්‍රසන්නකොට රැක කල් ගත නොකොට වහාම නිවන් සිරි සැපත ලබන් නේය.

110

වෙත්වා සව්සත සැමකල් නිදු කී
ප ත් වා සැපතට බවදුක් වැල කී
යෙත්වා නිවණට සමගිව මුනි කී
මෙත්බා වන නම් වැඩි පින්කම කී

සියලු සත්ත්වයෝම සෑමකල්හි දුක් රහිත වෙත්වා සසර දුකින් වැලකා සම්පත්තියට පැමි ණෙත්වා සමගිව මුනින්ද්‍රයන් විසින් ප්‍රකාශ කළාවූ නිර්වාණයට පැමිණෙත්වායයි කියා මෛත්‍රී භාවනාවනම් අධිකවූ පුණ්‍ය්‍යකර්මයක්මය.

111

ය හ ප ත නොසිතන සැපි මේ ද න යා
කි පි ය ත උනුනට මෙත්වී ද න යා
හැ ම ස ත වනකල මෙත් බා ව න යා
සැකනැත සගමොක් සැප සා ද න යා

මේ ලෝවැසි ජනයා යහපත නොසිතන ආකාරය! පුදුමයි, ජනයා කිසිකල්හි ඔවුනොවුන්ට මෛත්‍රී උපදවාසෑම සත්වයා මෛත්‍රී භාවනාව වඩන කල්හි ස්වර්ගමොක්‍ෂ සම්පත් සාදාගැණීම සැකයක් නැත්තේය.

112

දෙන් නන් දන දුන් රන්සේ පොලිය ට
දු න් දු න් සේ තම කළ පින් අනුන ට
එ න් නේ දිගුණුව දිගුණුව තමහ ට
ඉ න් දැ න් නුකුසීවව් පින් දීම ට

ධනවත් ජනයා විසින් පොලී පිණිස දුන් නාවූරත්රන් පරිද්දෙන් තමන් විසින් කළාවූ පුණ්‍යය අන්‍යයන්ට දුන් සැටියට තමාට දිගුණ දිගුණව එන්නේය, එසේහෙයින් මේ කාලයෙහි අනුන්ට පින්දීමට මැලි නොවව්.

113

මු නි දු න් බණපද කරවා පුහු ණු
දෙස මින් දනහට වඩමින් කුළු ණු
එපිණෙන් නොපැමිණ නිරයට දරු ණු
ලැබ ගන් සගමොක් මතු සිරි දිව් ණු

මුනීන්ද්‍රයන්වහන්සේ විසින් දෙශනාකරණලද ධර්ම පදයන් ප්‍රගුණකොට ලෝවැසි ජනයාට කරුණාව වඩමින් දෙශනා කර ඒ කුශල පුණ්‍යයෙන් දරුණුවූ නිරයට නොගොස් අනාගත කාලයෙහි ව්ගුණකොට ස්වර්ගමොක්‍ෂ ශ්‍රිය ලබාගනු.

114

දි ව ම න් මුනිඳුන් දුටුමෙන් තො ස වා
බ ණ ද න් නන්හට වැඳ අත් ඔ ස වා
ප ද යෙ න් පදයට අදරින් අ ස වා
එපිණෙන් නිරයට යනමං ව ස වා

ජීවමාන සර්‍වඥයන්වහන්සේ දුටුවාක්මෙන් සතුටුව බණ දන්නාවූ ධර්‍මකථිකයන්ට අත් උස් කොට වැඳලා පදයක් පදයක් පාසා අදරයෙන් අසා ඒ ශ්‍රවණමය පිංණින් නිරයට යන්නාවූ මාර්‍ගයන් ආවරණය කරව්. වහගණිව්.

115

දුරු කොට හැමවිට සිත ඇති මා නේ
ගරුකොට වැඳ වැඳ දුටුතෙක් මා නේ
මු නි ඳු ට පුදකළ බත් මල් පා නේ
ස ත හ ට සඟමොක් මග එම පා නේ

සෑමකල්හිම සිතෙහි ඇත්තාවූ මාන්නය දුරු කොට දුටුතෙක් පටන් ගෞරවකොට වැඳ වැඳ මුනීන්‍ද්‍රයන්වහන්සේට බත් මල් හා පහන් පූජාකළ සත්‍වයාහට එම කුශලකර්‍මයතෙම සවර්‍ග මොක්‍ෂ මාර්‍ගයන් ප්‍රකාශකරන්නේය.

116

ඇ ත ලොව වන පස මල් හැම දව සා
කොත නක පිදුවත් මුනිඳුන් උදෙ සා
සි ත මෙවිතර පිණටත් නොමසල සා
ස ත සසරින් ගැලවෙන්නේ කෙලෙ සා

සෑමකල්හිම ලොකයෙහි වනප්‍රදෙශයන්හි මල් ඇත්තාහුය, මුනීන්‍ද්‍රයන්වහන්සේ උදෙසා කොයි ස්ථානයෙක්හි පූජකළත් මහත්ඵල වේමයි, මෙපමණ පහසු පිණකටවත් සිත නොසලස්වා සත්‍වතෙම සසරින් මිදෙන්නේ කොයි ලෙසින්ද?

117

මුනි පුත් සහගණ මව්පිය ගුරුව ර
ජර පත් කුලදෙටු ගිලන්නුන් තවස ර
රැකසිත් සේකළ අත්පා මෙහෙව ර
සුව පත් කර සිරි විඳිනුය සුරපු ර

සර්‍වඥ පුත්‍රවූ සඞ්ඝයාද මව්පියන්ද ගුරුවරයන්ද ජරාවට පැමිණියන්ද කුලජ්‍යෙෂ්ඨයන්ද ශිල්‍පීන්ද තපස්විවරයන්ද රක්‍ෂාකොට සිත්වූ පරිද්දෙන් කළාවූ අත් පා මෙහෙවර කරණකොට ගෙණ සුවපත්කොට දිව්‍ය පුරයෙහි ඓශ්වර්‍ය්‍ය විඳින්නේය.

118

ලොව ඇත් තන් නුවනින් විමසා දැ ක
සිත නැත් තන් යයි නොතබා වෙනස ක
ගුණ ඇත් තන් ගුණ කීම නොවී සැ ක
නුව නැත් තන් පින් කරණ උපාය ක

ලොකයෙහි ඇත්තාවුන් විසින් නුවණින් පරීක්‍ෂාකොට බලා තමාට අහිත තැනැත්තන් යයි වෙනසක් නොතබා ගුණ ඇත්තන්ගේ ගුණය සැක නොකොට කීම නුවනැත්තන් විසින් කුසල් කරන්නාවූ උපායෙකි (මාර්ගයෙකි.)

119

ගොඩලම්නේ සත්වග බව දු කිනේ
ගෙන නිවනේ සිටුවන තුටු සි තිනේ
තුනු රුවනේ ගුණ සිහිකළ ම තිනේ
නැත විඳිනේ දුක් සසරෙහි ඉ තිනේ

සත්ව වර්ගයා සංසාර දුඃඛයෙන් ගොඩදමමින් සතුටු සිතින් ග්‍රහණයකොට නිර්වාණයෙහි පිහිටුවන්නාවූ ත්‍රිවිධ රත්නයෙහි ගුණය සිහිකළාවූ මාත්‍රයකින් සංසාර දුඃඛයන් ඉතින් විඳීමක් නැත්තේය.

120

පින් මිස නෑයෝ වන පිහිටක්නැ ත
මින් මතු හිමිවන දෙය ඇත්තෙත් නැ ත
ඉන් මතු අදහා සිහිකරතොත් ස ත
අන් කුසලක් නොකළත් මෙමදේ ඇ ත

කුශලය මිසක් නෑයන්වන්නාවූ පිහිටක් නැත්තේය, මේ ජාතියෙහි රැස්කරණ ධනාදියෙන් අනාගතයෙහි අයිතිවන්නාවූ දෙයක්ද නැත්තේය. එසේහෙයින් අනාගතය අදහා සඬ තෙම සිහිකරන්නේනම් අන්‍ය කුශලයක් නොකලේවීනුමුත් මෙම කුශලයම ඇත්තේය.

121

පුරවා සත්රුවනින් මුලු දෙර ණය
කරවා පායක් බඹලොව පම ණය
බඳවා රන්දද ලාම්ණි තොර ණය
දෙනවා වත් වැඩි පින් බුත්සර ණය

මුලු පෘථිවිය සත්රුවනින් පුරවා බ්‍රහ්මලොකය පමණ උසට ප්‍රාසාදයක් කරවා මාණික්‍ය තොරන්හි ස්වර්ණධ්වජ බඳවා දෙනවාටත් වඩා බුදුරජානන් වහන්සේගේ සරණයෙහි පිණ වැඩිය.

122

අසමින් මෙදහම් අලසව නොසි දේ
පුරමින් මෙසියලු පින්කම් නිබ දේ
කෙලෙසුන් මුල් නොතබා සිත පසි දේ
ලැබගන් සගමොක් මතු දුක් නොවි දේ

මේ බණ ශ්‍රවණයකරමින් අලසව නොසිඳ මේ සකල පුණ්‍යකර්මයන් නිතර සම්පූර්ණකරමින් සිත පිළිබඳ කෙලසයන්ගේ මුල් ඉතිරි නොකොට ප්‍රච්ඡෙදනය කොට මත්තෙහි දුක් අනුභව නොකොට මොක්ෂ සුවය ලබාගනුව.

123

සිඟපත් එකෙක් පෙර අනුරුදු තෙරුන්ද කා
තමලත් බතින් දුන්නේ එකම සැන්ද කා
බලවත් එයින් සුරපතිවිය ඉන්ද කා
තියවත් කරව් දන්පින් පල මෙසින් දු කා

පූර්වයෙහි සිඟිමට පැමිණියාවූ දුගීඑකෙක් අනුරුඩ සථවිරයන් දැක තමා විසින් ලැබූවාවූ බතෙන් දනය කෙළේ එකම සැන්දක් පමණය. ඉන්දක නම් ඒ දුගීතෙම බලවත්වූ ඒ කුශලයෙන් ඉන්ද්‍රක නම් දිව්‍යරාජව උපන්නේයි, ඥණවනත යෙනි දන් පින් ඵලය මෙයින් දැනගෙණ කර (පිය)ව්.

124

දව සක් පමණ සිල්රැකි කුලඟනෙක් පෙ රා
දහ සක් සුරඹ පිරිවරමින් රුවින් ස රා
තවසක් දෙව්ඳු ලඟ සිරි විඳි නිරන්ත රා
විග සක් එසිල් තොරනොකරව් සිතින් ද රා

පෙර එක් දවසක් පමණ සිල්රැක්කාවූ කුල ස්ත්‍රියක්තොමෝ රූපයෙන් සාරවූ දහසක් සුර ඟනන් පිරිවරමින් අද දක්වාම නිතර සක්දෙව් රජු සමීපයෙහි සිරිසැප විඳින්නීය. එබැවින් ඒ ශීලය දරාගෙණ ක්‍ෂණයකුදු සිතින් පහ නොකරව්.

125

කෙලෙසුන් සිතින් තොරකර සිතු ත නාමය
නි දු කි න් ගෙණෙයි බඹලොව සැප මනාමය
සු ද සු න් නිවන් දෙයි මරසෙන් දි නාමය
පිණ කි න් උතුම් පිණනම් බාව නාමය

කෙලශයන් සිතින් ඉවත්කර සිත තනාගන්නේමය (තනාගත්තොත්) මනොඥවූ බ්‍රහ්ම ලොක සැපය නිරායාසයෙන් හැරගෙණ දෙයි, මාරසේනාව ජයගෙණම මනා දැකුම් ඇත්තාවූ නිවණ දෙන්නේය, එබැවින් පිණෙන් උතුම් පිණනම් භාවනාමය පිණමයි.

126

කළ පින් දීමනම් තමසිත සතුටුකො ට
බැඳි රන් හිණෙක දෙව්ලොව සයට නැගුමට
නැගිපුන් සඳෙකි අව බියගිම් නිවීම ට
නිති පින් එසින් දෙව දුටු දුටු දනන්හ ට

කරණලද පිණ තම සිත සතුටුකර අනුන්ට දීමනම් දිව්‍යලොක සයට නැග්මට බඳිනලද්දාවූ රනින් කළ හිණිමගෙකි, අපාය භය නැමති ග්‍රීෂ්මය නිවීමට නැංගාවූ (උදාවූ) පූර්ණ චන්ද්‍රයෙකි, එබැවින් දුටු දුටු ජනයාහට නිතර පින් දීම කරණු.

127

දන් දෙන සඳෙහි දෙව්රම් වෙහෙර මුනිඳු ට
පින් ලැබගතිය වැඩිතරමින් එසිටුහ ට
පින් අනුමෝදන්ව මිනිසෙක් එතනසි ට
ඉන් දුන නුදුන කිම අනුමෝදනාව ට

ජේතවනාරාමයෙහි සර්වඥයන්වහන්සේට දන් පිළිගන්වන කල්හි ඒ ස්ථානයෙහි සිට පින් අනුමෝදන්වූ මනුෂ්‍යයෙක් ඒ සිටානන්ටත් වැඩිතරම් පින් ලබාගත්තේය, එබැවින් පින් අනුමෝදන්වීමට දුන්නේද නුදුන්නේද වෙනස කිමද?

128

බු දු න් දෙසන බණ මිහිරෙම්ම සිත තැ නී
ප ස න් ව උන් මැඩියෙකු කැවිටකින් ඇ නී
එ සි න් මිය තිදස ලද ඉසුරු නොපම නී
මෙව න් දහම් ඇසුමට මැලිනොවව් දැ නී

සර්වඥයන්වහන්සේ විසින් දෙශනාකරන්නාවූ ධර්මය පිළිබඳ ශබ්දයාගේ මධුරතාවෙන්ම සිත තැනී ප්‍රසන්නව උන්නාවූ මැඩියෙකු කෙවිට

කින් ඇනී එයින් මැරීගොස් තව්තිසා භවන යෙහි ප්‍රාමාණාතික්‍රාන්තවූ ඓශ්වය්‍යීය ලැබුයේය. "සුදනෙනි" මෙබඳුවූ ධර්‍මය දන ඇසීමට කම් මැලි නොවව්.

129

දුක් පත් සතෙක් මුන්දුන් වෙත සිත පැහැදී
එක් දුගැබක දියබෙරලිය මලක්පි දී
සක් විති සැපත් ඉන් පන්සිය වරෙක ල දී
දුක් නැත මෙපුද කරතොත් අකුසලෙන්මිදී

දුප්පත් මිනිසෙක්තෙම සර්‍වඥයන්වහන්සේ කෙරෙහි සිත ප්‍රසන්නව එක දුගැබෙක්හි දිය බෙරලිය නම් මලක් පුජාකෙළේය, ඒ කුශල හේතුවෙන් පන්සියයක් වාරයෙහි චක්‍රවර්ති සැපය ලැබුයේය, අකුශලයෙන් මුක්තව මෙබඳු පූජාකෙරේනම් දුක් නැත්තේය.

130

කල්හොත් සිල්වතුන්හට නිති වතා ව ත
දු වූ ස ත් කෙනෙක් වෙති ඔහට ඉතා හිත
නැන ඇත් තවුන් සාදන පින් වතා ව ත
එ ම හ ත් පිණෙකි දනගණ්තොත් හිතා හිත

සීලවන්තයන්ට නිතියෙන් වතාවත් කෙළේ නම් දුටුවාවූ සත්‍වකෙනෙක් ඔහුට ඉතාම වැඩ කැමතිවන්නේය, නුවනැත්තවුන් විසින් වතා වත් පිළිබඳ පිණය සිඩකරන්නේය, වැඩ අවැඩ දනගණ්තොත් එය මහත්වූ පිණක්ය.

131

පි න් කම් කරණ අය ඒ දිවි ණුවන ලෙ ස
ම න් සන්තොසින් එහි ගුණ කියත ඇතිලෙස
උ න් උපනුපන් තැන පැතිරෙයි ලොව යසස
පු න් සඳ පහන්වූ මෙන් එදහමේ බ ස

පින්කම් කරන්නාවූ ජනයාගේ ඒ කුශලය දිණුනුවන පරිද්දෙන් සිත්සතොසින් යථාභූතවූ පරිද්දෙන් ඒ කුශලයෙහි ගුණය කියන්නේනම්

උපනුපන්නන්හි පූර්ණචන්ද්‍රයා ආලෝක කළාක් මෙන් ලොකයෙහි ඔවුන්ගේ කීර්ත්‍ය පැතිරෙන්නේය. ඒ බුඩ වචනයෙකි.

132

තිසරණ ගත් එක් මිනිසෙක් එක් කලෙක
නොපැමිණ දුගතියට සිට කප් ලක් තිසෙක
අපමණ සැපත් සහ මොක්සැපලදිනි සැක
එසරණ නොගෙණ නොපිවිදිනේඇයිමෙදු

එක් කාලයෙක්හි තිසරණය ගත්තාවූ එක මනුෂ්‍යයෙක් කල්ප තිස්එකක් වනතුරු දුගතියකට නොගසින් අප්‍රමාණ ලෞකික සැප හා මොක්‍ෂ සැපය නිසැකව ලද්දේය. ඒ සරණ නොගෙණ නොපි මේ සසර දුක් විඳින්නේ කිම්ද?

133

අනුවණ කමින් සිහිනොකරණු මිස සත ත
අසරණ නොපට පිළිසරණක්මය දිමු ත
බුදුගුණ සිතින් එකහව සිහිකරතහොත
අපමණ සැපත් සිදුවෙයි සැක නොකර සිත

අඥානකමින් සතතයෙන් සිහිනොකරණුවා මිසක් අසරණවූ නොපට බුඩගුණය දීප්තිමත්වූ ප්‍රතිෂ්ඨාවක්මය, එකහවූ සිතින් යුක්තව බුදුගුණ සිහිකරන්නේනම් අප්‍රමාණවූ සම්පත්තිය සිඩ වන්නේය, ඒ ගැණ සිත සැක නොකරණු.

134

ලොවට උතුම් මුනිරජ්ගේ ගුණ විපු ලෙ
සිතට රැගෙණ සිහිකල නුවණින් නිබ ලෙ
සතට නොවී කලෙකත් බවදුක් අස ලෙ
යසට මෙසින් වැඩවේ සුබසිරි මගු ලෙ

ලොක ශ්‍රෙෂ්ඨවූ මුනිරජානන් වහන්සේගේ මහත්වූ ගුණය සිතටගෙණ නිර්මලවූ නුවණින් සිහිකළාවූ සත්වයාහට දීර්ඝකාලයෙක්හිත් සසර දුක සමීපනොවී මේ කරණකොටගෙණ යස ලෙස සොභනවූ ශ්‍රී මඞගල්‍යය වර්ණනාය වේ.

135

තොද  න ලෙවන් හට පව් පින් නියමකො ට
බ  ද  ලෝවැඩ සඟරා පිණිනි සතහ  ට
ල  ද  සැපතින් තොරනොව ලැබ නිතිපිහිට
වැ  ද  සව්සත සැනසෙත්වා මොක්පුර  ට.

අඥනවූ ලෝකවාසීන්ට සියලු පව් හා පින් නියමකර බන්ධනය කරණ ලද්දාවූ ලෝවැඩ සඟරා පිණෙන් සත්‍වයාහට සැපතින් වෙන් නොවී නිරතුරු පිහිට ලැබී සකල සත්‍වයෝම නිවන්පුරයට වැදී ශාන්තවෙත්වා.

136

වි දු  ගම වෙහෙරෙහි **මෙත් තෙරිඳු** ස  ද
සාදු  රණව පවසාලා සිතින් න  ද
බා දු  නොවී මොක් දකුමට බැඳි මෙප  ද
පා දු  සතුන් සිත පවතිවා නිබ  ද.

විදුගමෙහිවූ විහාරයෙහි මෛත්‍රී ස්ථවිරයන් විසින් සතුටු සිතින් සියල්ලට සාධාරණ පරිද්දෙන් ප්‍රකාශකොට බාධාවක් නොලැබ නිවන් දක්මට බඳිනලද මේ පද්‍යය සත්‍වයන්ගේ සිත් ප්‍රසන්නකොට නිරන්තරයෙන් පවතීවා.

---

වි  දු  ගමහි තෙරිඳුගෙ ලෝවැඩ සඟ  ර
බා  දු  නොවී සගමොක් සැප දෙන පව  ර
පා  දු  රුත් **තෙරිඳු දේවන** කළ මෙව  ර
සා  දු  සත සුසිරි පවතීවා නිතො  ර